# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.23 පැය 2245 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 821 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

## 01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2025.04.23 වන අද දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්ටේස් පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 22 මිලිග්‍රෑම් 10 ක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 55 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වත්තල පොලිස් ස්ථානය.

2025.04.23 වන අද දින සවස් කාලයේ වත්තල පොලිස් වසමේ දේවාල මාගර්යේදී වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 150 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 32 ක් වන වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වත්තල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. නීතිවිරෝධී මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වලාන දූෂන මදර්න ප්‍රහාරක ඒකකය.

2025.04.23 වන අද දින උදෑසන කාලයේ මොරගහහේන පොලිස් වසමේ අරඹ පාර මහඇල ඉවුර ප්‍රදේශයේදී වලාන දූෂන මදර්න ප්‍රහාරක ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 75 (බෝතල් 100)ක් හා මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 1512 (බැරල් 08ක්) සමග** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මොරගහහේන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 68 ක් වන බණ්ඩාරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරගහහේන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.

2025.04.23 වන අද දින දහවල් කාලයේ ඇතිමලේ පොලිස් වසමේ කොටියාගල ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 55 ක් වන කොටියාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි. වැටලීමට අදාල ජායාරූපයක් මේ සමග ඔබ වෙත යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**